# A Concise Study of Rituals and Etiquette in Tāntric Buddhism

## තාන්ත්‍රික බුදුසමයෙහි පුදසිරිත් හා අභිචාර විධි පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

**සාරසංක්ෂේපය**

පෙරදිග ගුප්ත ශාස්ත්‍රයන් අතර තන්ත්‍ර ශාස්ත්‍රය විෂයෙහි හිමි වන්නේ ඉතා සුවිශේෂී ස්ථානයකි. මානව සන්හතියේ ආරම්භය යම් කලෙක සිදු වී නම් තන්ත්‍ර ශාස්ත්‍රයෙහි ආරම්භය ද ඒතාක් ඈත ඉතිහාසයකට දිව යන බව බොහෝ වියතුන්ගේ මතයයි. ප්‍රාග් ඓතිහාසික මානවයා මූලික වශයෙන් තම ලෞකික අපේක්ෂාවන් ඉටුකර ගැනීම පිණිස තන්ත්‍ර නම් ශාස්ත්‍රය ගුප්ත ඉගැන්වීමක් ලෙස භාවිතා කළහ. නමුත් මෙය කවදා, කවරෙකු විසින් කුමන කරුණක් මුල්කොටගෙන ආරම්භ කරන ලද්දේදැයි නිෂ්චිතව සඳහන් කිරීමට නිෂ්චිත සාධක නොමැත. ගුප්ත ශාස්ත්‍රයක් ලෙස ක්‍රමයෙන් සංවර්ධනය වූ තන්ත්‍ර වෛදික උපනිෂද් ආදි සාහිත්‍ය යුගයන් තුළ ආගමික අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස ද උපයෝගි කොටගත් අයුරු දැකගත හැක. ඒ අනුව ලෞකික අභිමතාර්ථ සඳහා පමණක් නොව ලෝකෝත්තර අරමුණු විෂයෙහි ද තන්ත්‍රයන්ගේ බලපෑම ක්‍රමයෙන් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස නොයෙකුත් ආගමික සංකල්ප තන්ත්‍ර ශාස්ත්‍රය විෂයෙහි ඇතුල් වූ බව පෙනේ.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර ගණනාවකට පසු තන්ත්‍ර ශාස්ත්‍රය පදනම්ව නව බෞද්ධ සම්ප්‍රදායයක් ආරම්භ වන්නේ මහායාන බුදුසමයේ ඉගැන්වීම් වල ප්‍රතිඵලයක් ලෙසිනි. නමුත් තාන්ත්‍රික බෞද්ධ ඉගැන්වීම් තුළ දැක්වෙන්නේ තන්ත්‍රයානය බුදුරදුන් විසින් ම දේශනා කළ ඉගැන්වීමක් බවයි. මේ සඳහා ඔවුහු බුද්ධකාලීන නොයෙකුත් මූලබීජ ගෙනහැර දක්වා ඇත. කෙසේ වෙතත් ක්‍රමයෙන් සංවර්ධනය වූ තන්ත්‍රයානය වර්තමානයේ නව බෞද්ධ සම්ප්‍රදායයක් ලෙස ලෝකයේ බොහෝ සෙයින් ප්‍රචලිතව ඇත. එහි බලපෑම මහායාන සම්ප්‍රදායට මෙන් ම ථෙරවාදයට ද බොහෝ සෙයින් සිදු වී ඇති බව නිකායාන්තර බෞද්ධ චින්තනයන් අධ්‍යයනයේ දී දැකගත හැකි ය. තන්ත්‍රයානයෙහි දැකගත හැකි සුවිශේෂී ලක්ෂණයක් ලෙස ගුප්ත සංකල්ප භාවිතය පෙන්වාදිය හැක. මුද්‍රා විදහා දැක්වීම, මණ්ඩල භාවිතය, ධාරණී භාවිතය මෙන් ම සංකේත භාවිතය ඒ අතර ප්‍රධානය. මෙම අධ්‍යයනයේ දී උක්ත තන්ත්‍රයානයෙහි සඳහන් ගුප්ත අභිචාර විධි හා පුදසිරිත් පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක් සිදු කොට ඇත.

**ප්‍රමුඛ පද :** අභිචාර, තන්ත්‍ර, මුද්‍රා, මණ්ඩල , ධාරණී

**හැඳින්වීම**

මානව සංහතියේ ආරම්භය යම් කලෙක සිදුවූයේ නම් එකල තන්ත්‍ර ශාස්ත්‍රයේ ආරම්භය වූ බව බොහෝ වියතුන්ගේ පිළිගැනීමයි. මේ නිසා තන්ත්‍ර කවදා, කෙසේ, කවරෙකු විසින් ආරම්භ කළේදැයි පැවසීම ශාස්ත්‍ර විරෝධිය. කුමක් සඳහා තන්ත්‍ර යනුවෙන් හඳුන්වන ශාස්ත්‍රය ආරම්භ කළේ ද යන ගැටලුවට ද එක් පිළිතුරක් සැපයීම අපහසු ය. තන්ත්‍ර නමින් හඳුන්වන ක්‍රියාවලිය මිනිසුන්ගේ

වැදගත් අංග දෙකක් නියෝජනය කරයි. එනම් **ශබ්දය හා චලනයයි.** එය ප්‍රධාන ඉන්ද්‍රිය දෙක මඟින් ග්‍රහණය කළ යුතු ය. සන්නිවේදනයේ දී ප්‍රබල වන්නේ මෙම අවස්ථා දෙකය.

සමාජගත වූ මිනිසා සිය ජීවනෝපාය පිණිස විශ්ව ශක්තීන් උපයෝගි කොට ගත්තේ ය. අව්ව වැස්ස සුළඟ ඒ අතරින් ප්‍රධාන වේ. ඒවා මෙහෙය වන්නේ කෙසේ ද? තමාට අවශ්‍ය පරිදි පාලනය කිරීම පිණිස කුමන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ද යන ගැටලුව විසඳීම සඳහා මිනිසා සිය සරල අත්දැකීම් යොදාගත්තේ ය. තවෙකෙකු සමඟ සම්බන්ධ වීමේ දී ශබ්දය හා චලනය ප්‍රබල මාධ්‍යයක් විය. මෙයම බාහිර ලෝකය මෙහෙයවීම පිණිස ප්‍රමාණවත්යැයි ප්‍රාථමික මිනිසාගේ පිළිගැනීම විය. විශ්ව ශක්තීන් වන සූර්යයා චන්ද්‍රයා වර්ෂාව සුළඟ දේව නැමැති වචනයෙන් හැඳින්වීමත් පසුව මෙම දෙවිවරු ජීව ගුණයක් ඇති ප්‍රාණීන් ලෙස හැඳින්වීමත් තන්ත්‍ර නම් ගුප්ත ශාස්ත්‍රය දියුණුවීම පිණිස හේතු විය. ස්වල්ප උත්සහයකින් තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සරල මාර්ගයක් සෙවූ මිනිසා තන්ත්‍ර හෙවත් ශබ්ද හෙවත් ශක්තීන් උපයෝගී කොටගෙන තම අභිමථාර්ථ සාධනය පිණිස උත්සහ කළේ ය. සරල ක්‍රමවේදයක් ඔස්සේ ඇරඹි මෙම ක්‍රියාවලිය මෙලොව පරලොව අභිමථාර්ථ පිණිස යොදාගත හැකි යැයි විශ්වාස කිරීමත් සමඟ සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත්විය.

භාරතයේ පමණක් නොව ලෝකයේ විවිධ රටවල් වල යම් යම් වෙනස්කම් සහිතව ඇරඹුණු මෙවැනි ගුප්ත ක්‍රමවේද වර්තමානය දක්වා ක්‍රියාත්මකව පවතියි. භාරතය තුළ ප්‍රාග් වෛදික සමාජයන්හි මෙවන් ගුප්ත ශාස්ත්‍ර ක්‍රියාත්මක වූ බවට හරප්පා හා මොහෙන්දෝජාරෝ ශිෂ්ටාචාර සාක්ෂි දරයි. විශේෂයෙන් ස්වභාව ධර්මය දේවත්වයට නැගීමත් දෙවියන්ගේ විශේෂ ශක්තීන් හඳුනාගැනීමත් තුළ දෙවියන් සහ මිනිසුන් අතර සන්නිවේදන මාධ්‍යයක් ලෙස තන්ත්‍ර භාවිත විය. එමඟින් ලෞකික හා ලෝකෝත්තර අරමුණු ඉටුකර ගැනීමත් අපේක්ෂා කොට ඇත.

තන්ත්‍ර ඉතා සංකීර්ණවූත් විචිත්‍රවූත් ගුප්ත විද්‍යාවක් ලෙස සළකනු ලබන්නේ එය ක්‍රමයෙන් සංවර්ධනය වන විට ඊට එකතු වූ විවිධ ප්‍රයෝගයන් නිසා ය. එම ප්‍රයෝග යන්ත්‍ර, මන්ත්‍ර, ධාරණී, ධාකිණී, මණ්ඩල, දේවතා, යෝග, ව්‍රත වශයෙන් දැක් වේ. ආරක්ෂාව අපේක්ෂාවෙන් තන්ත්‍ර යොදාගන්නා විට යන්ත්‍ර මන්ත්‍ර ධාරණී ධාකිණී දේවතා වැනි ප්‍රයෝග යොදාගනු ලබන අතර ඉෂ්ටාර්ථය සිද්ධිය සළකා තන්ත්‍රවල භාවිතය මුද්‍රා, මණ්ඩල, යෝග, ව්‍රත යන ප්‍රයෝග ඔස්සේ සිදුකරගනු ලබයි. ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන චතුර්වර්ග සම්පත්තිය තන්ත්‍රවලින් ලබාගත හැකිවේයැයි විශ්වාස කරති. තන්ත්‍රවල ඍජු සංවිධානය හින්දු දර්ශනයත් සමඟ සිදුවුවත් ඊට පෙර මෙවැනි වූ අපේක්ෂාවෙන් තොරව තන්ත්‍ර භාවිත කළ බව ඉතිහාසය පරීක්ෂාවෙන් පැහැදිලි වේ.

## තාන්ත්‍රික බුදුසමය

තන්ත්‍රයානය වූ කලි වතර්මාන ලෝකයේ පවත්නා ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදාය තුන අතරින් එකකි. ඓතිහාසිකත්වය අතින් සළකා බලන කල්හි තන්ත්‍රයාන සම්ප්‍රදාය තුන්වැන්න වේ. ථෙරවාදය අද පවත්නා පැරණිම සම්ප්‍රදාය ලෙස පිළිගැනේ. බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව බුදුරදුන් විසින් ධම්මචක්කපවත්තන සූත්‍රය දේශනා කිරීම ආදි බුදුදහමෙහි ආරම්භය ලෙස සැළකිය හැක. එය ථෙරවාදයට වඩාත් සමීප වූවකි. එසේම මධ්‍යමක සම්ප්‍රදාය හෙවත් ශූන්‍යතාවාදී චින්තනය ආරම්භ වීම දෙවැනි ධර්මචක්‍ර ප්‍රවර්තනය ලෙස මධ්‍යමක සම්ප්‍රදායවාදීහු සඳහන් කරනු ලැබේ.

තන්ත්‍රයානිකයින් පිළිගන්නා ආකාරය අනුව තන්ත්‍රයාන සම්ප්‍රදායෙහි ආරම්භය තථාගතයන් වහන්සේගේ තෙවැනි ධර්මචක්‍ර ප්‍රවර්තනය වේ. එහෙත් විඥානවාදීන් හෙවත් චිත්තමාත්‍රතාවාදීන් සඳහන් කරනුයේ තෙවැනි ධර්මචක්‍ර ප්‍රවර්තනය වනුයේ ඔවුන්ගේ චිත්තමාත්‍රතා දර්ශනය ඉදිරිපත් කිරීම බවයි. කෙසේ වෙතත් ඓතිහාසිකව බලන කල්හි තන්ත්‍රයානය වූ කලී සම්භාව්‍ය බෞද්ධ ආගමික ඉතිහාසයෙහි නවතම සම්ප්‍රදාය බව බොහෝ වියතුන්ගේ අදහසයි.

තන්ත්‍රයානය ආරම්භ වූ අවදිය පිළිබඳ ව විද්වතුන් අතර ඒකමතිකත්වයක් නැත. ඒ.කේ. වෝඩර් විද්වතාගේ අදහස අනුව මෙම සපම්දාය ඉන්දියාවෙහි ආරම්භ වනුයේ ක්‍රි.ව. හයවන සියවසෙහි දී ය. තන්ත්‍රයානිකයන්ගේ සාම්ප්‍රදායික විශ්වාසය හා ටිබෙට් වාර්තාවල සඳහන් වනුයේ එම සම්ප්‍රදායෙහි මතිමතාන්තර බුදුරදුන් විසින් ම බුද්ධත්වයෙන් දොළොස්වන වසරේ ශ්‍රීධනකටයේදී දේශනා කරන ලද බවයි. බුදුරදුන් විසින් දේශනා කරන ලද තන්ත්‍රයානය උන්වහන්සේගේ ඉල්ලීම පරිදි එය අවබෝධ කිරීමට හැකි පිරිස් ලොව ඉපදෙන තෙක් පැවතීම සඳහා දකුණු ඉන්දියාවේ චෛත්‍යයක වජ්‍රසත්ව නම් මහා සිද්ධවරයා විසින් නිදන් කළ බවට විශ්වාසයක් ඇත. මෙම චෛත්‍ය විවෘත කොට නාගාර්ජුන ආචාර්යපාදයන් විසින් තන්ත්‍රයාන ග්‍රන්ථ එළියට ගෙන ප්‍රචාරයට පත්කළ බව ද විශ්වාස කෙරේ.

තන්ත්‍රයානයෙහි ආරම්භය පිළිබඳ වගකීම තන්ත්‍රයානිකයින් විසින් සුප්‍රකට මහායාන බෞද්ධාචාර්යවරුන් වන නාගාර්ජුන හා අසංග හිමිවරුන් දෙදෙනා වෙත පවරණු ලැබේ. මෙම ආචාර්යවරුන් ජීවත් වූ සමය හා තන්ත්‍රයානය ඇති වූ කාලය අතර ඇති පරතරය අනුව බලන විට මෙය සිදුවිය නොහැක්කක් වුවත් තන්ත්‍රයාන සම්ප්‍රදාය තුළ ශුන්‍යතාවාදී හා විඥානවාදී මූලධර්ම අන්තර්ගතව ඇති ආකාරය විමසා බලන කල්හි පෙනී යනුයේ තන්ත්‍රයාන සම්ප්‍රදාය ශුන්‍යතාවාදී හා විඥානවාදී අදහස් ද ඇතුල් කොටගත් බෞද්ධ චින්තනයේ ක්‍රමික විකාශයක් බවයි. එම අර්ථයෙන් බලන විට මෙම මහායාන ආචාර්යවරුන් තන්ත්‍රයානයෙහි ආරම්භකයින් ලෙස නම් කිරීමේ දෝෂයක් නොපෙනේ.

තන්ත්‍රයානය ආරම්භ වූයේ කිනම් ප්‍රදේශයකදැයි යන්න පිළිබඳව ද ඍජු පිළිතුරක් සැපයීම අපහසු ය. සමහර වියතුන්ගේ මතයට අනුව තාන්ත්‍රික බුදුසමය ඉන්දියාවෙන් පරිබාහිර ප්‍රදේශයක ඇති වී පසුව ඉන්දියාව දක්වා විකාශය වී ඇත. එහෙත් සාධනමාලාවේ තාන්ත්‍රික බුදුසමයට සම්බන්ධ ඉන්දීය ප්‍රදේශ හතරක් පිළිබඳ තොරතුරු දැක්වෙන බැවින් තන්ත්‍රයානය ඉන්දියාවේ ම ප්‍රභවය වූ බැව් පිළිගැනීමට සිදු වේ. එම ප්‍රදේශ නම් **කාමාඛ්‍යා, සිරිහත්ත, පූර්ණගිරි සහ උඩ්ඩියානා ය** යන ප්‍රදේශයන් ය. කාමාඛ්‍යා සහ සිරිහත්ත යන ප්‍රදේශ දෙක පිහිටා ඇත්තේ ඇසෑම් ප්‍රාන්තයේ ය. කාමාඛයා හෙවත් කාමරූප ඇසෑමයේ වර්තමාන අගනුවර වන ගවුහතී නගරයට නුදුරුව පිහිටා ඇත. වර්තමාන සෛල්හට් පැරණි සිරිහත්ත නගරයයි. වර්තමාන පූනේ නගරය අතීතයේ පූර්ණගිරි නම් විය. අතීත උඩ්ඩියානා ප්‍රදේශය ස්වැට් නිම්නයට අයත් ප්‍රදේශයක් ලෙස ඉන්දියානු පර්යේෂකයෙක් වන S.C.Das හඳුනාගෙන ඇත. උඩ්ඩියානා කැෂ්ගාරයේ ප්‍රදේශයක් ලෙස M. Sylain Levi නම් කොට ඇත. එහෙත් හරප්‍රසාද් ශාස්ත්‍රී උඩ්ඩියානා ප්‍රදේශය ඔරිස්සාව ලෙස නම් කෙරෙයි.

## තාන්ත්‍රික බුදුසමයේ හමුවන අභිචාර විධි හා පුදසිරිත්

### ධාරණී භාවිතය

සංස්කෘත බෞද්ධ සාහිත්‍යයේ මහායාන හා තන්ත්‍රයාන සම්ප්‍රදායයන්ට අයත් කෘති අතර ආගමික හා දාර්ශනික වශයෙන් වැදගත්වන පාරිභාෂික වචනයක් ලෙස ධාරණී යන්න හැඳින්විය හැක. ධාරණී යන්න දැරීම, ඉසිලීම, දරාසිටීම වැනි තේරුම් දෙන වචනයකි. එසේ දරාසිටින්නේ කිසියම් වූ සත්‍ය ඥාණයකි. නැතහොත් ධර්ම ග්‍රන්ථයක් හෝ විද්‍යාවකි. ප්‍රමාණාත්මකව මිණිය නොහැකි ඥාන සම්භාරයක් සම්පිණ්ඩනය වී ඒ තුළ අන්තර්ගත වී ඇති හෙයින් එය ධාරණී නම් වේ. තන්ත්‍රයානයේ බෙහෙවින් භාවිත කරනු ලබන ධාරණී පාඨ හෝ පද ඉහත සඳහන් පරිද්දෙන් සත්‍ය වූ ඥානසම්භාරයන් අන්තර්ගත කොට සකසනු  ලැබූ මහා බලසම්පන්න ප්‍රකාශනයක් ලෙස සළකනු ලැබේ. යමෙක් ධාරණී පාඨ මතක තබා ගන්නේ නම් ඒවා නැවත නැවත උච්ඡාරණය කරන්නේ නම් එම පද තුළ සැඟව ඇති සත්‍ය ඥානයේ බල මහිමය ඔහුගේ ආරක්ෂාව ඇතුලු සියලු අර්ථ සිද්ධීන් සපුරාලන බව ඔවුන්ගේ පිළිගැනීමයි. ධාරණී නම් වූ පාඨ විශේෂය ඊට ඇතුලත් විශේෂත්වය සළකාගෙන මහා සාංඝික බෞද්ධ සම්ප්‍රදාය සිය ත්‍රිපිටකයේ කොටසක් ලෙස පිළිගෙන ඇත.

එම පිටකය ධාරණී හෙවත් විද්‍යාධර පිටකය නමින් හඳුන්වා තිබේ. මේ හැරුණු කොට මහායාන බෞද්ධ සාහිත්‍යය තුළ ද ධාරණී පද ව්‍යවහාර කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුව තිබුණු බව පෙනේ. සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ එක් පරිච්ඡේදයක් මුළුමනින්ම ධාරණී පාඨ සඳහා වෙන් කොට ඇත. එසේ සිදුකර ඇත්තේ ආධ්‍යාත්මික අවශ්‍යතාවලට අමතරව දෛනික ජීවිතයේ මුහුණපාන අමනුෂ්‍යාදි උපද්‍රව ව්‍යසනයන්ගෙන් ආරක්ෂා වීම සඳහා ය. ලංකාවතාර සූත්‍රයේ ද එක් පරිච්ඡේදයක් ධාරණී පාඨ සඳහා වෙන්කර ඇත. මේ හැර සුඛාවතී ව්‍යූහ අමිතායුෂ් වැනි මහායාන සූත්‍රවල ද ධාරණී පාඨ කෙරෙහි විශේෂාවධානයක් යොමුකර ඇති බව පෙනේ.

තන්ත්‍රයාන බුදුදහම ප්‍රමුඛ බෞද්ධ සම්ප්‍රදායක් ලෙස ව්‍යවහාරයට පැමිණිය දා සිට එතෙක් ඉතිහාසයේ වර්ධනය වෙමින් පැවති ධාරණීපාඨ වලට වඩාත් ගෞරවණීය ස්ථානයක් හිමිකර දී ඇති අයුරු පෙනී යයි.

මේ අනුව ධාරණී පාඨ නම් සජ්ඣායනීය පාඨ මුල් බෞද්ධ යුගයේ සිටම බෞද්ධයාගේ සැළකිල්ලට ලක් වෙමින් වර්ධනයට පත්ව එහි උච්ඡ අවස්ථාව තන්ත්‍රයානය තුළ පිළිඹිබු වන බව කිව හැකි ය. මේ අනුව බෞද්ධ ධාරණී පාඨ කොටස් තුනකට වර්ග කළ හැක.

01. **හීනයාන ධාරණී** - (ආටානාටිය, ගිනි පිරිත, මෝර පිරිත, හා මහාසාංඝික ධාරණී පිටක.)

02. **මහායාන ධාරණී** - (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, ලංකාවතාර සූත්‍රය, සුඛාවතී ව්‍යූහ සූත්‍රය.)

03. **තාන්ත්‍රික ධාරණී** - (අෂ්ඨදේවි පිරිත, ත්‍රිරත්න ධාරණී.)

තාන්ත්‍රික ධාරණී පාඨ බැලූ බැල්මට නිශ්චිත තේරුමක් ගත නොහැකි පුනරුක්ත සහිත අක්ෂර හා පද සංයෝජන සේ පෙනේ. එසේ වුවත් එය ඉහාත්ම වශයෙන් ජීවිතයේ සමෘද්ධිය පිණිස උපයෝගී කරගත හැකි මහානුභාව සම්පන්න සජ්ඣායනීය පාඨ විශේෂයක් ලෙස සැළකේ. ආධ්‍යාත්මික

අරමුණු සපුරා ගැනීමේ දී ද ලෞකික අරමුණු මුදුන්පත් කරගැනීමේදී ද ධාරණී මඟින් මහත් රුකුලක් ලැබෙන බව තාන්ත්‍රික බෞද්ධයන්ගේ පිළිගැනීමයි. තන්ත්‍රයාන බෞද්ධ සම්ප්‍රදාය පිළිගනු ලබන කන්ජූර් පිටකයේ මන්ත්‍ර තන්ත්‍ර ඇතුලත් පරිච්ඡේදයන්හි ධාරණී නමින් වෙසෙසනු ලැබූ පාඨ විශාල ප්‍රමාණයක් සංග්‍රහ කර ඇත. ඊට අමතරව කන්ජූර් පිටකයේ එක් කාණ්ඩයක් ධාරණී නමින් නම්කර ඇත.

තාන්ත්‍රිකයන් අනුගමනය කරන කන්ජූර් පිටකයේ ඇතුළත් ධාරණී සංග්‍රහයේ දැනට හඳුනාගෙන ඇති පරිදි ග්‍රන්ථ 263 ක් ඇතුලත් වේ. එම ග්‍රන්ථයන්හි ආධ්‍යාත්මික අරමුණු සඳහාත් ලෞකික විවිධ අර්ථ සිද්ධි සඳහාත් උපයෝගී කරගැනීමට නිර්දිෂ්ට ඉපැරණි ධාරණී පාඨ විශාල ප්‍රමාණයක් ඇතුලත් වේ. මෙම ධාරණී මඟින් ආධ්‍යාත්මික අවශ්‍යතාවයන්ටත් වඩා තාන්ත්‍රිකයන් අපේක්ෂා කළේ දෛනික ජීවිතයට අවශ්‍ය දෑ සපුරා ගැනීමයි. යක්ෂ රාක්ෂ භූත පිසාච ප්‍රේතාදි අමනුෂ්‍ය උපද්‍රවයන්ගෙන් ආරක්ෂාව සහතික කරලීම බොහෝ ධාරණී පාඨයන්ගෙන් ඔවුන් අපේක්ෂා කළ එක් අරමුණකි. මිනිසාගේ සිත් සතන් තුළින් අමනුෂ්‍ය බය දුරුකරලීමට මෙන්ම අමනුෂ්‍යයන් ලවා අභිමත කාර්යයන් සාධනය කිරීමටත් ඔවුන් ඒවා උපයෝගී කරගෙන ඇත. අමනුෂ්‍ය උපද්‍රව වලින් ආරක්ෂාවීම මෙන් ම දෛනික ජීවිතයේ කම්කටොළු දුක් කරදර ලෙඩ රෝග අනතුරු අලාභහානි අපකීර්ති පීඩා ආදිය වළක්වා ගැනීමෙහිලා උපයෝගි කටයුතු ධාරණීපාඨ ඇතුලත් විශාල කෘති ප්‍රමාණයක් ද යථෝක්ත පිටකයේ ඇතුලත් ය. නිදසුන් ලෙස **ජ්වර ප්‍රශමන ධාරණිය** උණ රෝගීන් සුවපත් කිරීමට යොදාගන්නා ධාරණියකි. සියළු දුක් සමනය කිරීමට වූ ධාරණියක් ලෙස **සර්වදුක්ඛ ප්‍රශමන ධාරණිය** ද, බුද්ධිය දියුණු කිරීම සඳහා **ප්‍රඥාවර්ධනී ධාරණිය** ද, අවශ්‍ය අවස්ථාවල දී පුද්ගලයන්ට ශුභාශිර්වාද පැමිණවීම සඳහා **ස්වස්තයන ගාථා හා මංගල ගාථා සජ්ඣායනය** ද, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් විවිධ රැකවරණ හා සම්පත් ලබනු වස් **ත්‍රිරත්නස්වස්තිගාථා සජ්ඣායනය** ද උපයෝගී කරගත හැකි ය.

**මුද්‍රා භාවිතය**

තන්ත්‍රයානයේ ආගමික අභ්‍යාස අතර මුද්‍රා විදහා දැක්වීම කෙරෙහි හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. මන්ත්‍රපාඨ, ධාරණී පාඨ මඟින් අදෘශ්‍යමාන බලවේග සක්‍රීය කරගන්නා අතර මුද්‍රා විදහා දැක්වීම මඟින් එය වැඩිදුරටත් තම අභිමථාර්ථ ඉටුකරවා ගැනීම පිණිස යොමුකර ගත හැකි ය. මුද්‍රා යන්නෙන් මෙහි අදහස් කරන්නේ දෙඅතෙහි ඇඟිලි ය. යම් රටාවක් අනුව සංකේතාත්මකව ආධ්‍යාත්මික අදහස් නිරූපනය වන පරිදි ඇඟිලි සංවිධානය කරගැනීමයි. එමඟින් යමක් වාචිකව දැනුම් දීමකට වඩා ප්‍රබල ලෙස ආධ්‍යාත්මික ලෝකය සමඟ ගණුදෙනු කල හැකි බව ඔවුන්ගේ විශ්වාසයයි. දෑතේ ඇඟිලි එකිනෙක එක්කල විට සංකේතාත්මකව සමස්ත විශ්වය එහි නිරූපනය වන බව කියනු ලැබේ. සුලැඟිල්ලේ සිට මහපටැඟිල්ල දක්වා මෙම විශ්වයේ සියලු පදාර්ථ එනම් පඨවි ආපො තේජො වායො සහ ආකාශ යන පංචකය පිළිවෙළින් නියෝජනය වන බව ඔවුන්ගේ දැක්මයි. ඒ අනුව දසැඟිලි තුළ සමස්ත විශ්වය නිරූපනය කෙරෙන බව ඔවුහු විශ්වාස කෙරෙති. බුද්ධ බෝධිසත්ව ප්‍රතිමාවන්හි යම් ප්‍රමාණයක් මුද්‍රා දක්නට ලැබෙන නමුත් අතැගිලි ඇසුරින් සන්නිවේදනය කළ හැකි මුද්‍රා විශේෂ දහස් ගණනක් වෙතැයි තන්ත්‍රයානයේ සඳහන් ය. තාන්ත්‍රික ප්‍රතිපදාව ඇසුරින් මේ ජීවිතය තුළ දී විමුක්තිය ලබාගැනීමට අපේක්ෂා කරන්නෙකු පරිනත ගුරුවරයෙකු ඇසුරින් මුද්‍රා විශේෂ ප්‍රගුණ කළ යුතු වේ.

තන්ත්‍රයානික ගුරුවරයෙකුගේ මඟ පෙන්වීම අනුව නිසි පරිදි දසැගිලි මඟින් අදාළ මුද්‍රා විදහා දක්වන විට ක්ෂණිකව එම පුද්ගලයා තුළ ආධ්‍යාත්මික පරිවර්තනයක් ද කිසිසේත් නොසිතූ අයුරින් ගුප්ත බල මහිමයක් ද උත්පාදනය වන බව කියනු ලැබේ. මෙවැනි ආශ්චර්යවත්ත අත්දැකීම් මෙන් ම ඉහාත්ම වශයෙන් බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීම පවා එය නිරතුරුව ප්‍රගුණ කරන්නෙකුට ලබාගත හැකිවන බව විශ්වාස කෙරේ.

තන්ත්‍රයාන සම්ප්‍රදාය තුළ ගුරු උපදෙස් පරිදි භාවනානුයෝගීව ආධ්‍යාත්මික අභ්‍යාසයන්හි යෙදෙන්නෙකුගේ සිතෙහි පහළ වන අදහස් දෑතෙහි දසැගිලි එක්වීමෙන් මුද්‍රා ලෙසින් ප්‍රකාශනය වන බව, ඒ අනුව සිත හා බාහිර ප්‍රකාශනය (මුද්‍රා) අතර අනන්‍යතාවක් ප්‍රකාශ වන බව ද හඳුනාගෙන තිබේ. එක් අතකින් මුද්‍රා යනු නියෝජනයක් යැයි කිව හැකි ය. ඉන්, බුදුවරුන් හා බෝධිසත්වවරුන් එක් අතකින් නියෝජනය වේ. අනෙක් අතට එම යෝගියා තුළ ඇති ආධ්‍යාත්මික පාරිශුද්ධිය හා එහි අනුක්‍රමික ප්‍රවර්ධනය නියෝජනය වේ. තවද භාවනානුයෝගියෙකු තුළින් හස්ත මුද්‍රා ප්‍රකාශවීමේ දී අදෘෂ්‍යමාන ලෙස එම මුද්‍රා ඇසුරින් රශ්මි කඳම්භයක් පිටවන අතර ඉන් කෙනෙකුට වන පීඩා මඟහරවනු පිණිස අදෘෂ්‍යමානව වජ්‍ර පවුරකින් වජ්‍ර ජාලයකින් ආරක්ෂා කෙරෙන බව ද ඉන් කෙනෙකුට වන පීඩා මඟහරවන බව ද ඔවුන්ගේ පිළිගැනීමයි. තන්ත්‍රයානයේ උගන්වන පරිදි දසැගිලි ඇසුරින් විවිධාකාරයේ මුද්‍රා ආකෘති ප්‍රකාශයට පත් වේ. පුෂ්පේ, දීපේ, ගන්ධේ, දූපේ, ධර්මෙ යනු ඉන් මූලික මුද්‍රා ආකෘති කිහිපයකි.



PADYAM
*Bathing Water (white)*



DHUPE
*Incense (smoke-c.)*



Basic Mudras in Vajrayana

selected by Jampa Namgyal



NAIVIDYA
*Food (multi-c.)*



ARGHAM
Nectar (white)



PUSHPE
Flowers (white)

**අභිෂේක**

මෙය හිස මත පැන් වැක්කිරීම හෝ ඉසීම අභිෂේක මංගල්‍ය ලෙස හඳුන්වනු ලැබේ. සංකීර්ණ වූ ආගමික වත් පිළිවෙත් අනුව තාන්ත්‍රික බෞද්ධයන් අතර නිරතුරුව දක්නට ලැබෙන උත්සවයකි. තාන්ත්‍රික බුදුදහම තුළ ආචාර්යවරයා සිය ශිෂ්‍යයා ගුහය ධර්ම මාර්ගයක් වෙත යොමු කිරීමෙහිලා පවත්වනු ලබන චාරිත්‍ර විධිය මෙයින් අදහස් වේ. මෙහි දී බාහිරව පෙනෙන ආකාරයෙන් සිදුවන්නේ මන්ත්‍ර ධාරණී වැනි පාඨ සජ්ඣායනා කරමින් වජ්‍රාචාර්යවරයෙකු විසින් උසස්ම ආගමික අවස්ථාවක දී ශිෂ්‍යයෙකුගේ හිස මතට පැන් වත් කිරීමයි. එසේ වුවත් මෙහි දී භාවිත කරනු ලබන ජලය ඔවුන් අදහන පරිදි බුදුවරුන් තුල පැවති අපරිමිත මහාකරුණාව සංකේතවත් කෙරේ. එසේම වැඩිදුරටත් හිසමත වත්කෙරෙන එම ජලය සත්‍යාවබෝධය ලද බුද්ධාදී උත්තමයන්ගේ පංචවිධ ඥානය ද අදහස් කෙරේ. එම පංචවිධ ඥානය නම්,

01. ධර්මධාතු ස්වභාව ඥානය

02. ආදර්ශ ඥානය

03. සමතා ඥානය

04. ප්‍රත්‍යවේක්ෂණ ඥානය

05. කෘත්‍යානුෂ්ඨාන ඥානය

යනුවෙනි. මේ අනුව අභිෂේකයේ දී මහා කරුණාව හා මහා ප්‍රඥාවත් සංකේතවත් කෙරෙන ජලය ආශිර්වාදාත්මක ලෙස ආධුනිකයෙකුගේ ආධ්‍යාත්මික ගමන් මාර්ගය දෙසට අවතීර්ණවීම හෝ කිරීම චාරිත්‍රානුකූලව සිදුකෙරේ.

අභිෂේකය නොලද අයෙකුට මන්ත්‍ර විශේෂයෙන් මහා බලසම්පන්න මන්ත්‍ර පාඨ භාවිතයට අවසර නොලැබේ. මුද්‍රා මණ්ඩල වැනි සැඟවුණු සංකේතාර්ථ සහිත අභ්‍යාස විධි එවැන්නෙකුට හඳුන්වා දීම ද නුසුදුසු බව සඳහන් වේ. මහ වෛරෝචන සූත්‍රයෙහි අභිෂේකය නොලද අයෙකුට ගුහ්‍ය ධර්ම හඳුන්වාදීම පවා නොකළ යුතු යැයි එහි සඳහන් වීමෙන් පෙනෙන්නේ තාන්ත්‍රික බුදුදහම තුළ අභිෂේකය නම් වූ චාරිත්‍ර විධියට ආගමික වශයෙන් කෙතරම් උසස් ස්ථානයක් හිමිවේද යන්නයි. වජ්‍රාචාර්යවරයෙකු සතු ඥාන සම්භාරය සහ ගුප්ත බල මහිමයන් සමූහය අභිෂේකයේ දී ආධුනිකයා

වෙත සම්ප්‍රේෂණය වන බව ද නැතහොත් යථෝක්ත බල මහිමයන් ආධුනිකයා තුළට පිවිසීම වැනි පරිවර්තනයන් සිදුවන බව ද ඔවුන්ගේ විශ්වාසයයි. අභිෂේකය ලද මොහොතේ සිට ශිෂ්‍යයා තුළ ආධ්‍යාත්මික වශයෙන් ද බාහිර වශයෙන් ද එවැනි ගුණාත්මක විපර්යාසයන් දක්නට ලැබෙන බව ද තාන්ත්‍රිකයෝ තරයේ විශ්වාස කරති.

**මණ්ඩල භාවිතය**

මණ්ඩල යනු තාන්ත්‍රික බෞද්ධ භාවනා අභ්‍යාස සඳහා මෙන් ම විවිධ චාරිත්‍ර විධි ආගමික සංස්කාර සඳහා උපයෝගි කොටගනු ලබන වෘත්තාකාර රූප සටහන් මණ්ඩලයකි. පටපිළි කඩදාසි මත මෙන් ම භූමියේ ද ආගමික අවශ්‍යතා අනුව එය නිරූපනය කරනු ලැබේ. එමෙන්ම වර්ණාලේපිත පබළු ලෝහාදී මාධ්‍යන්ගෙන් මෙන් ම ශෛල මත හෝ වෙනත් දැවමුවා ඔපමට්ටම් කරනු ලැබූ විශේෂිත මාධ්‍යයන්ගෙන් ද අවශ්‍යතා පරිදි මෙය නිර්මාණය කෙරෙන අතර කැටයම් කිරීම මඟින් ද එය නිරූපනය කරනු ලැබේ. එමෙන් ම ඒ ඒ තාන්ත්‍රික ගුරුකුල අනුව එකිනෙකට වෙනස් වූ මණ්ඩල රූ සටහන් ද දැකිය හැකි වන අතර ඒවායේ ප්‍රමාණාත්මක වෙනස්කම් ද පවතින බව සඳහන් කළ හැකි ය. එම ආකෘතිය තුළ අරුත් සැඟවුණු ගුහ්‍ය ධර්මය සංකේත මඟින් නිරූපණය කොට ඇත. ඔවුන් පිළිගන්නා පරිදි එහි දැක්වෙන සංකේත මඟින් අප ජීවත් වන විශ්වයේ පරමාර්ථමය තත්ත්වාකාරය නියෝජනය වේ. තාන්ත්‍රික බුදුදහම පිළිපදින අනුගාමිකයෙකු ජීවිතය හා ලෝකය පිළිබඳ පරමාර්ථ වශයෙන් පවත්නා යථාර්ථය පිළිබඳ ගැඹුරු අවබෝධයක් දැක්මක් ඇතිකර ගැනීම පිණිස ගුරු උපදේශ අනුව එය උපයෝගී කොටගනු ලැබේ. භාවනාමය වශයෙන් පෞද්ගලිකව යථෝක්ත පරමාර්ථමය සත්‍යය තත්ත්වය පිළිබඳ දැනුමක් ඇතිකර ගැනීම පිණිස ද මාධ්‍යයක් ලෙස මණ්ඩලය ඔවුහු උපයෝගී කොට ගනිති.

මණ්ඩ+ල යන පද දෙකේ එකතුවෙන් මෙම වචනය සෑදී ඇති අතර එහි "**මණ්ඩ**" යනු හරය සාරය යන තේරුම දෙන පදයකි. ඒ අනුව "**ල**" යනු දැරුම හෝ දරන්නා යන තේරුම දෙන පදයකි. ඒ අනුව එහි අර්ථය වන්නේ සාරය දරන්නා හෝ දැරීම යන්නයි. සමස්ත ලෝකයෙහි විචිත්‍රත්වය තුළ ගැබ්වන පරමාර්ථමය හරය මණ්ඩල මඟින් නියෝජනය වන බව එයින් කියැවේ.

මණ්ඩල තුළ මූලික වශයෙන් සංකේත මඟින් කිසිසේත්ම දෘෂ්‍යමාන නොවන දිව්‍ය සමූහයක් නිරූපනය කරයි. ඇතැම්විට සංකේත අකුරු මඟින් එම දිව්‍ය සමූහයාට අදාළ බීජ මන්ත්‍ර සටහන් කර තිබේ. එම බීජ මන්ත්‍ර හා දිව්‍ය සමූහයා ලෙස අර්ථකථනය කරන්නේ බුදුවරු හා බෝසත්වරු ය. එමෙන් ම විවිධ දෙවිවරු හා අනේකවිධ සත්‍ය තරංග ඊට ඇතුලත් ය. තාන්ත්‍රිකයන් භාවිතා කරනු ලබන බෙහෙවින් ප්‍රකට මණ්ඩල ද්වයක් ද මෙහි දී සඳහන් කිරීම වටී. එනම්,

01. ගර්භධාතු මණ්ඩලය

02. වජ්‍රධාතු මන්ඩලය

**ගර්භධාතු මණ්ඩලය**

ගර්භධාතු මන්ඩලය සංකේතවත්ව රතු පැහැයෙන් නිරූපනය කෙරේ. එහි මැද පෙති අටකින් යුත් රත් පැහැති නෙළුමකි. මෙම නෙළුම මැද වැඩ සිටින්නේ වෛරෝචන බුදුන් වහන්සේ ය. පෙති

අටෙහි සෙසු බුදුවරු හා ප්‍රධාන බෝධිසත්වවරු දැක් වේ. මේ බුදුවරු හා බෝධිසත්වයන් වටා දෙවිවරු වෙති. පෙති අටකින් යුක්ත නෙළුම විශ්වයේ හෘදය යැයි කියනු ලැබේ. විශ්ව හෘදය පෞද්ගලික හෘදයේ සංකේතය වශයෙන් ද ගෙන සිත එකඟ කොට භාවනා කිරීමෙන් සිත තුළ බුදුවරුන් හා බෝධිසත්වවරුන් මවා ගත හැකි ය.

**වජ්‍රධාතු මණ්ඩලය**

වජ්‍රධාතු මණ්ඩලය ද චක්‍රාකාර සටහනකි. එහි පැහැය සුදුය. එහි කොටස් නවයකට බෙදා දැක්වේ. මැද ඇත්තේ පිපුණු සුදු නෙළුමකි. ඒ නෙළුම මැද ධ්‍යානයට සම වැදුණු වෛරෝචන බුදුන් පිළිඹිබු කරන වජ්‍ර සංකේතය දැක් වේ. ඒ වටා සුදු රැස් වළල්ලක් විහිද පවතී. එය වටා අක්ෂෝභ්‍ය, අමිතාභ, රත්නසම්භව, අමෝඝසිද්ධි ආදි බුදුවරු වෙති. මේ බුදුවරුන්ගේ ජනිත වූ තවත් දෙවිවරුන් ද මේ මණ්ඩලයේ දැක් වේ. මන්ත්‍ර ජප කිරීමෙන් බීජාක්ෂර මැතිරීමෙන් මුද්‍රා නිරූපනය කිරීමෙන් ආරාධනා කරනු ලැබූවිට ඒ බුදුවරුන් හා දෙවිවරුන් තුළ සැඟවී යටපත් වී ඇති බලය ඉස්මතුව ක්‍රියාකාරී වීමට පටන් ගනී. එසේ හෙයින් වජ්‍රධාතු මණ්ඩලය මෙන් ම ගර්භධාතු මණ්ඩලය ද තාන්ත්‍රිකයන්ගේ ආගමික චාරිත්‍ර විධි සමඟ සමීපව බැඳී පවතින බව මෙහිදී කිව යුතු ය.

මණ්ඩල සංකල්පය ආගමික මනෝවිද්‍යාවට බුදුදහම මඟින් එකතු කරනු ලැබූ ඉතා වැදගත් ආධ්‍යාත්මික සංකේතයකි. එහි පෙන්නුම් කරනු ලබන්නේ ලෝකයේ පවත්නා නමුත් දෘෂ්‍යමාන නොවන යථාර්ථයකි. එය නරඹන්නෙකුට සියලු විචිත්‍රතාවයන්ට යටින් මේ ලෝකයේ පවත්නා පවිත්‍රතාව ශුද්ධවන්ත බව පිළිබඳ ඉඟියක් ලැබේ. එමෙන් ම වජ්‍රයාන බෞද්ධයන් අදහන පරිදි ඒ යථාර්ථය සාක්ෂාත් කළ හැකි නම් සියලු දුකින් මිදී යථාර්ථය දැකීමෙන් මේ ජීවිතය තුළදීම බුද්ධත්ව අනුභූතිය ලද හැකි බව කියනු ලැබේ. එමෙන් ම කෙනෙකුට සැඟව ඇති යථාර්ථය පිළිබඳ අදහස මඟින් තමන් තුළ ද බුදුවරුන් හා බෝසත්වරුන් වැඩ වෙසෙතියි යන හැඟීම ඇතිකර ගත හැකිවනු ඇත.









## යුගනද්ධ

තන්ත්‍රයාන බුදුදහමේ විවිධ ආගමික අභ්‍යාසයන්ගේ අවසාන අපේක්ෂාව වන්නේ යුගනද්ධ නම් වූ තත්ත්වය සාක්ෂාත් කර ගැනීමයි. මෙම ආධ්‍යාත්මික අනුභූතිය විටෙක බුද්ධත්ව අනුභූතිය ලෙසින් ද මහා සුඛය ලෙසින් ද හඳුන්වා දී තිබේ. දාර්ශනික වශයෙන් ඉන් අදහස් කරන්නේ අන්‍යොන්‍ය නිෂේධන ලක්ෂණයෙන් යුත් ද්වන්ද්‍ව චරණ සංඛ්‍යාත ද්වයතාවයෙන් මිදී ආධ්‍යාත්මික අද්වය තත්ත්වය අත්දැකීමයි. තන්ත්‍රයානයේ උසස්ම ආගමික පාරිභාෂික පදවලින් හඳුන්වන විට ශූන්‍යතාව හා කරුණාව යන ධර්ම දෙක කෙනෙකුගේ ආධ්‍යාත්මික දැක්ම තුළ චරිතය තුළ එකිනෙක වෙන් කළ නොහැකි පරිද්දෙන් එක්වීම ඒකත්වයට පත්වීම නැතහොත් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි සේ සම්මිශ්‍රණය වීම හෝ ඒකීකරණය මින් අදහස් වේ. ලුණු වතුරේ දිය වූ විට ලුණු හා වතුර ලෙස එය දෙකක් වුවත් එහි රසය එකකි. එනම් ලුණු රසයයි. කෙනෙකුගේ චරිතයන් තුළ ද එකිනෙක වෙන්ව හඳුනාගත නොහැකි පරිදි කරුණාවත් ශූන්‍යතා ඥාණය හෙවත් ප්‍රඥාවත් අන්තර්ගත විය යුතු බව ප්‍රවර්ධනය විය යුතු බව ඔවුන්ගේ අර්ථ ගැන්වීමයි. යමෙක් කරුණාවෙන් තොරව ශූන්‍යතාව පමණක් ප්‍රගුණ කරන්නේ නම් එය ද තන්ත්‍රයානයේ අපේක්ෂිත තත්වාගමන නොවේ. අනෙක් අතට යමෙක් මුළුමනින්ම චරිතය තුළ කරුණාව පමණක් ම අනන්‍ය කරන්නේ නම් ඔහුට ද අවසාන පරමාර්ථය අධිගමනය කළ නොහැකි ය. ප්‍රිය - අප්‍රිය, සුභ - අසුභ, ස්ත්‍රී - පුරුෂ, කරුණාව - ප්‍රඥාව යනාදී වශයෙන් කෙනෙකුගේ දැක්ම හා චරිතය තුළ ද්වයතාවාදී කල්පනාවන්ගෙන් මිදීම යුගනද්ධය යනුවෙන් අදහස් වේ.

මෙම ආධ්‍යාත්මික අනුභූතිය තන්ත්‍රයානය තුළ නාම ව්‍යවහාරයකින් දක්වන විට හේවජ්‍ර, වජ්‍ර සත්ව, චණ්ඩාලී යන ව්‍යවහාර ද ඇතැම් විට සඳහන් වේ. එම තත්ත්වය සංකේතාත්මකව දැක්වීමේ දී පද්මයකින් නැගෙන ගිනි දැල්ලක් ලෙසින් ද, කලාවෙන් කලාව වැඩී යන අඩ සඳක් ලෙසින් ද, බඳුනකින් හෝ පලසකින් ඉහළ නැගෙන ගිනි දැල්ලක් හෝ දීප්තියක් ලෙසින් ද, අමෘතය පිරි බඳුනක බහා ලූ අශෝක කිනිත්තක් ලෙසින් ද යුගනද්ධ තත්ත්වය නිරූපනය කර තිබේ.

මූර්ති ශිල්පීමය වශයෙන් දැක්වීමේ දී නිරතුරුව නිරූපනය කොට ඇත්තේ දෙවිවරුන් හා දෙවඟනන් එකිනෙකා අනුරාගී ආලිංගනයක යෙදී සිටින අයුරුයි. ටිබෙටයේ හා නේපාලයේ වජ්‍රයානිකයන් බොහෝ කොට මෙම උසස් අත්දැකීම මූර්තිමත් කර දක්වන්නේ ස්ත්‍රී - පුරුෂ, මාතෘ - පීතෘ අනුරාගී සම්භෝගයක් ලෙසිනි.

ඉහත සඳහන් කළ පරිදි යුගනද්ධ යන්නෙන් දාර්ශනිකව අදහස් කරන්නේ එකම සත්‍යයක් වූ යථාර්ථයේ අංශ දෙකක් වෙන් වෙන් ව පවතින අයුරුයි. නැතහොත් සංසාරය - නිර්වාණය, සංස්ලේශ - ව්‍යවදාන, ග්‍රාහ්‍ය - ග්‍රාහක යනාදී වශයෙන් පෙනෙන ද්වයතාව එකම සත්‍යයක ප්‍රකාරවීමයි. නිර්වාණය හා සංසාරය එකම සත්තාවක ප්‍රකාර දෙකක් පමණි. වෙන් වෙන්ව පවත්නා දෙකක් නොවේ යන අදහස හෙවත් අද්වය වාදය යුගනද්ධ යන්නෙහි අදහසයි. හේවජ්‍ර නම් කෘතියේ දී යුගනද්ධ තත්ත්වය වෙසසීම පිණිස බෝධිචිත්ත ප්‍රභාෂ්වර යන වචන යොදා තිබේ. තාන්ත්‍රික දර්ශනය තුළ මේ අනුව යුගනද්ධ යනු බුද්ධත්ව අනුභූතිය හෙවත් උසස්ම සත්‍යාවබෝධ තත්ත්වය වෙසෙසන පාරිභාෂික ශබ්දයක් සේ දැක්විය හැකි ය.

**ඩාකාණී**

තන්ත්‍රයාන බුදුදහමේ භාවනානුයෝගීව වෙසෙන අයගේ සිත් සතන් සසල කිරීමට මෙන් ම ඔවුන් එම අරමුණින් ඉවත් කිරීමට බලපවත්වන විවිධාකාරයේ ක්ලේෂ බලවේග හෝ මනෝභාවයන් පුද්ගලත්ව ආරෝපණයෙන් ඩාකිණී යැයි නම්කොට ඇත. තාන්ත්‍රික යෝගියෙකු ඩාකිණීවරු පරාජය කළ යුතු වේ. එම ධර්මය තුළ ඩාකිණී සංකල්පය අර්ථවත් කරන්නේ නග්න ස්ත්‍රී රූපයකිනි. නැතහොත් රූප සමූහයකිනි. මිනිස් මාංශ අනුභව කරන රුධිරය පානය කරන බොහෝ සෙයින් සුසාන භූමි හා හුදෙකලා ස්ථානයන්හි ගැවසෙන මිනිසුන්ට බිය හා තැති ගැනීම ඇතිකරන සංකේතාත්මක ස්ත්‍රී රූප සමූහයක් යථෝක්ත වචනයෙන් අදහස් වේ. මේ වචනයෙන් සංකේතවත් කරන්නේ පුද්ගල සන්තානය තුළින් ම මතුවන ලෝභ ද්වේෂ මෝහාදී බලවේගයන් ය. යම් යෝගියෙකු සුසාන භූමියේ දී භාවනා කරන විට ඩාකාණීවරුන්ගෙන් කිසිසේත් නොපෙලෙයි නම් ඔහුගේ අරමුණ සාක්ෂාත් කරගත හැකි ය. තන්ත්‍රයානය තුළ සැබැවින් ම ඩාකිණීවරු යෝගියෙකු තම අරමුණ සාක්ෂාත් කිරීමේ දිශාවට යොමු කරනට ආධාර උපකාරී වන සහායක පිරිසක් සේ හඳුන්වා දී තිබේ. මෙම සංකල්පයෙන් කියවෙන අදහස පාලි බෞද්ධ සම්ප්‍රදාය තුළ දැක්වෙන මාර පරාජය හා සම්බන්ධ කළ හැකි සමාන ලක්ෂණ දරයි. තාන්ත්‍රික දහම තුළ නිරතුරුව සඳහන් වන ඩාකිණියන් නම් වජ්‍ර ඩාකිණී, වජ්‍ර යෝගිනිය, වජ්‍රවරාහි, සර්ව බුද්ධ ඩාකිණී, සිංහවක්ත්‍රා යනු එවැනි සංකේතාත්මක මනෝභාවයන් නියෝජනය කෙරෙන ඩාකිණීවරියන් කිහිප දෙනෙකි.





## සමාලෝචනය

ප්‍රාග් ඓතිහාසික යුගයෙන් ආරම්භව සංවර්ධනය වූ තන්ත්‍ර ශාස්ත්‍රයේ ආභාසය ඉහත සඳහන් ආකාරයෙන් බුදුසමය විෂයෙහි බලපෑමත් සමඟ එය නව මුහුණුවරක් ගත් අකාරය දැකගත හැක. විශේෂයෙන් ආධ්‍යාත්මික සංවර්ධනය මෙන් ම ලෝකෝත්තර අභිමථාර්ථ සාධනය විෂයෙහි වැඩි නැඹුරු බවක් බෞද්ධ තන්ත්‍ර තුළින් පිළිඹිබු වේ. ඒ තුළින් ආදි බෞද්ධ ඉගැන්වීම් නව මුහුණුවරකින් අර්ථ කතනයට ලක් වූ බව ද පෙනේ. බෞද්ධ ඉගැන්වීම් විෂයෙහි විශේෂ වශයෙන් සංකේත භාවිතය මෙන් ම ගුප්ත ස්වභාවය ඇතුලත් වූයේ මෙම තන්ත්‍ර ශාස්ත්‍රයේ ආභාෂය තුළිනි. මෙහි පසුකාලීන සංවර්ධනයක් ලෙස ලෞකික අභිමථාර්ථ සාධනය විෂයෙහි ද බෞද්ධ තන්ත්‍ර උපයෝගි කොට ගන්නට යෙදුණි. එහි ප්‍රතිඵලයක් ලෙසින් නොයෙකුත් පුදපූජා මෙන් ම අභිචාර විධි බෞද්ධ තන්ත්‍ර තුළින් නිර්මාණය වූ අතර ඒවායෙහි දක්නට ඇති ආකාර්ෂණීය ස්වභාවය හා ආගමික

උපයෝගිතාව මත වර්තමානයේ සියලු බෞද්ධ සම්ප්‍රදායයන් තුළ ඉතා ජනප්‍රිය ආගමික අංගයන් ලෙස ක්‍රියාත්මක වන අයුරු දැකගත හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ප්‍රඥානන්ද හිමි, ගලගෙදර, (1961), *තිබ්බතයේ බොදුසමය,* ගුණසේන සමාගම.

සිරි සීවලී, බඹරන්දේ, (1964), *බෞද්ධ ලෝකය,* ගුණසේන සමාගම.

ධම්මදස්සි හිමි, නායිම්බල, (2964), *ටිබෙට් බුදුසමය.*

විමලඥාණ හිමි, නාඹටුන්නේ, (2016), *තාන්ත්‍රික බුදුසමය,* ගොඩගේ සහ සමාගම, කොළඹ.

සාසනරතන හිමි, මොරටුවේ, (1962), *ලක්දිව මහායාන අදහස්,* අනුලා මුද්‍රණාලය.

රාධක්‍රිෂ්නන්, (1979), *භාරතීය දර්ශනය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

E.J. Thomas, (1933), *History of Buddhist Thought*, London

Dashupta, S.B., (1958), *An Introduction to Tantric Buddhism*, University of Culcutta, Culcutta.

Lama Thubten Yeshe, (2001), *Introduction to Tantra*, Wisdom publications.